www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුද අපරාධ වාර්තාවක්

## A record of war crimes

**2010 ජූලි 27**

විකිලීක්ස් සන්ඩේ මගින් අන්තර්ජාලයේ පලකරන ලද දස දහස් ගනන් ලියවිලි, ඔබාමා පරිපාලනය තමන්ගේ ම කරගෙන ඇති අපරාධකාරී විජිත යුද්ධය පිලිබඳ සවිස්තරාත්මක සහ වේදනාකාරී චෝදනා පත්‍රයක් සම්පාදනය කරයි.

සිය සෘජු වෙලුම් තුල ලියවිලි 92,000කින් සහ පිටු 200,000කින් සමන්විත ඊනියා ඇෆ්ගන් යුද දිනපොත ඇෆ්ගන් ජනයාට එරෙහිව එක්සත් ජනපද මිලිටරිය වසර නවයකට ආසන්න කාලයක් තිස්සේ ත්‍රස්තයේ සහ ප්‍රචන්ඩත්වයේ මෙහෙයුමක් ගෙනගොස් ඇතිබවට නිසැක චෝදනාවක් ඉදිරිපත් කරයි.

එක්සත් ජනපද සොල්දාදුවන් සහ නිලධාරීන් විසින් ලියනලද සටන්භූමි වාර්තා ද ඇතුලත් මෙම ලියවිලි, සිය නිවාස මත එල්ල වන ගුවන් ප්‍රහාරවලින් මරාදැමෙන සිවිල්වැසියන්ගේ මරන පිලිබඳව සහ මාර්ග බාධකවල රාජකාරියේ නිරත වෙඩිතැබීමෙන් තෘප්තියට පත්වන භටයින් විසින් යතුරුපැදි, මෝටර් රථ සහ බස්වල ගමන් කරන ඇෆ්ගන් ජාතිකයින් වෙඩිතබා මරාදමන ආකාරය පිලිබඳව වාර්තා කරයි.

තලිබාන් සහ අල් කයිඩා නායකයන් දඩයම් කිරීම සහ මරාදැමීම පිලිබඳව චූදිත විශේෂ මෙහෙයුම් භටයන්ගෙන් සමන්විත රහස් "කලු" කන්ඩායමක් වන 373 වන කාර්ය බලකායේ මෙහෙයුම් වසා තිබූ ආවරනය එම ලියවිලි මගින් නිරාවරනය කරයි. අවම වසයෙන්, නඩු විභාග කිරීම පසෙක තැබුවත් කිසිදු වරදක් පිලිබඳව චෝදනාවක් පවා ඉදිරිපත් නො කර පෙන්ටගනය සහ සීඅයිඒය විසින් මරන දඬුවම නියම කරන ලද පුද්ගලයින් 2,000ක නම් ලැයිස්තුවක් පදනම් කර ගනිමින් මෙම ඒකකය කටයුතු කලේ ය. දොරවල් කඩාගෙන ඇතුලට පැන පහරදීමේ සහ ඉලක්ක කරගත් පුද්ගලයින්ට එරෙහිව ගුවන් ප්‍රහාර කැඳවීමේ ක්‍රියාදාමය තුල දී මෙම ඒකකයට අහිංසක මිනිසුන්, ගැහැනුන් සහ ලමුන් විශාල ප්‍රමානයක් මරාදැමීමට හැකිව ඇත.

පූර්ව අනතුරු ඇඟවීමකින් තොරව අනාරක්ෂිත ජනයා මත මරනය සහ විනාශය කැඳවමින් අඩි 50,000ක් දුර සිට සිය ගොදුරුවලට ප්‍රහාර එල්ල කරන නියමුවන් රහිත රීපර් සහ ප්‍රිඩේටර් ගුවන් යානා වඩ වඩා භාවිතා කිරීම ද මෙම ලියවිලි මගින් හෙලිදරවු වේ.

එමෙන් ම එක්සත් ජනපද මිලිටරිය මගින් සිදුකරනු ලබන සංහාරයන් ක්‍රමානුකූලව ආවරනය කිරීම ද මෙමගින් හෙලිදරවු කෙරේ. අවස්ථා ගනනාවක දී ම තුවාල ලද සිවිල් වැසියන් පිලිබඳ ලැයිස්තුගත වාර්තා ප්‍රසිද්ධ කෙරී නැත. තවත් අවස්ථාවල දී එක්සත් ජනපද වෙඩිතැබීම් මගින් ඝාතනය කරන ලද සිවිල් වැසියන් කැරලිකරුවන් ලෙස ලැයිස්තුගත කරනු ලබයි.

වසර නවයක යුද කාලසීමාව තුල සිදුකරන ලද එක් දරුනුම සමූලඝාතනයක් පිලිබඳ වාර්තාවක් විකිලීක්ස් වාර්තාව එලිදැක්වුනු දිනට පසුදින එක්සත් ජනපදය තුල ප්‍රසිද්ධ වීම හේතුවෙන් යුද්ධයේ මෙම මිනීමරු ස්වභාවය සහ මිලිටරි අධිකාරියේ ක්‍රමානුකූල බොරු කීම, බලගතු ලෙස හෙලිදරව් විය. බොහෝකොට ගැහැනුන් සහ ලමුන් ඇතුලත් මුලු පවුල් සමගින් 52 ක් ඝාතනය කරමින් සිකුරාදා හෙල්මන්ඩ් පලාතේ සිවිල් වැසියන් මත එල්ල කරන ලද එක්සත් ජනපද-නැටෝ රොකට් ප්‍රහාරයක් ජනාධිපති හමීඩ් කර්සායිගේ ආන්ඩුව විසින් ප්‍රසිද්ධියේ හෙලා දක්නා ලදී. සිය පවුල් මිහිදන් කරන ලද හා තුවාලකරුවන් ප්‍රාදේශීය රෝහලකට යවන ලද ප්‍රදේශයේ වැසියන් සමග කතා කිරීමට සහ මල සිරුරු ඡායාරූපගත කිරීමට විවිධ ප්‍රවෘත්ති ඒජන්සි සමර්ථ වෙද්දී එක්සත් ජනපද නීත වාඩිලාගැනීමේ හමුදාවේ ප්‍රකාශකයෙක් "සිවිල් වැසියන් අනතුරට පත්වීම පිලිබඳ සාක්ෂි නැතැයි" ප්‍රකාශ කලේ ය.

සඳුදා ලන්ඩන්හි පැවති මාධ්‍ය හමුවක් ඇමතූ විකිලීක්ස් ආරම්භක ජූලියන් ඇසෙන්ජ් පැවසුවේ ලියවිලි මගින් අනාවරනය කරනු ලබන විමර්ශනය කොට චෝදනා නැගිය යුතු යුද අපරාධ වලට සමාන තවත් සිද්ධීන් "දහස් ගනනක්" තිබෙන බවය.

තවත් වැදගත් කරුනක් වන්නේ සටන් බිමේ සිටින සොල්දාදුවන් ඔවුන් මුක්කුව දෙමින් සිටින කර්සායි රූකඩ තන්ත්‍රය පිලිබඳව දක්වන සැබෑ දැක්ම ද ලියවිල මගින් අනාවරනය වීමයි. ඇෆ්ගන් රාජ්‍යයේ කුලුනු ලෙස ක්‍රියාකරන ඇෆ්ගන් ජනයාගේ වෛරයට

ලක්වන යුද ලොක්කන්, මත්ද්‍රව්‍ය වෙලෙන්දන් සහ ඝාතකයින් විසින් සිදු කරනු ලබන අස්වාභාවික දූෂනය සහ පරපීඩාකාමී ප්‍රචන්ඩත්වය පිලිබඳව ඒවා හෙලිදරව් කරයි.

මෙම හෙලිදරව්වට ඔබාමාගේ ධවල මන්දිරය ප්‍රතිචාර දක්වා ඇත්තේ ඇෆ්ගනිස්ථාන යුද්ධය තවදුර ගෙනයන බවට සපථ වෙමින් සහ ලුහුඬු ලියකියවිලි අනාවරනය වීම හටයන්ගේ ජීවිත අනතුරේ හෙලා ඇත්තේ සහ "ජාතික ආරක්ෂාව" අනතුරට භාජනය කොට ඇත්තේ කෙසේ ද යන්න පිලිබඳ තර්ජනාත්මක ප්‍රකාශ නිකුත් කරමිනි.

මෙම ලියකියවිලි රහසේ තබාගැනීම සැලසුම් කරන ලද්දේ ඇමරිකානු සොල්දාදුවන් ආරක්ෂා කිරීමට නොව මෙම දීර්ඝතම ඇමරිකානු යුද්ධය කෙරෙහි වඩ වඩා සතුරු බවට පැමිනෙන ඇමරිකානු ජනයාගෙන් ඇෆගනිස්ථානය තුල සිදුකෙරෙන මිනිස් සංහාරයේ යථාර්ථය සැඟවීමට යි.

විකිලීක්ස් හෙලිදරවු කිරීම් සහ වසර 40කට ආසන්න කාලයකට පෙර වියට්නාමය තුල ඇමරිකානු මැදිහත් වීම යටින් පැවති බොරු සහ එහි එක්සත් ජනපද යුද්ධයේ සාපරාධී භාවය හෙලිදරවු කල පෙන්ටගන් පුවත්පත් අතර පෘථුල සන්සන්දනයන් සිදු කරමින් පවතී.

එහෙත් වෙනස්කම් වඩාත් සිත් කාවදින සුලු ය. ඒ සමයේ දී ඩැනියෙල් එල්ස්බර්ග් රහසිගත ලියවිලි හෙලිදරවු කලවිට ආන්ඩුවට එරෙහිව යමින් එම ලියවිලි වාර්තා අතර තැබීමට එක්සත් ජනපද සෙනට් සභිකයින් සූදානම්ව සිටි අතර ලියවිලි පලකිරීම සඳහා උසාවි ආඥා ලබාගැනීමට සටන් කරමින් *නිව් යෝක් ටයිම්ස්* පුවත්පත ආක්‍රමනශීලීව ඒවා පසුපස ලුහුබැඳී ය.

අද වනවිට ඒ හා සමාන කිසිවක් කිරීමට සෙනට් සභාව හෝ ඩිමොක්‍රටික් පක්ෂය තුල කිසිදු අර්ථභාරී චරිතයක් නැත. මාධ්‍යයන් සම්බන්ධයෙන් ගතහොත් ඇෆ්ගන් ජනයාට එරෙහිව එක්සත් ජනපදය සිදුකරන ප්‍රචන්ඩත්වයේ විස්මයජනක මට්ටම් ලියවිලි මගින් හෙලිදරවු කිරීමෙන් පසු එම අපරාධ පිලිබඳ පිලිකුල හෝ තිගැස්ම ප්‍රකාශයට පත්කිරීම ඉතා අල්ප හෝ ඇත්තේ ම නැති තරම් ය. බොහෝ මාධ්‍ය ආවරනයන් තුල කේන්ද්‍රීය කරුන වන්නේ මෙම වාර්තා හෙලිදරවු කිරීමේ නීත්‍යානුකුල භාවය මිස ඒවායේ බියකරු අන්තර්ගතය නො වේ.

*ටයිම්ස්* පැත්තෙන් ගත්කල එය තම අදහස පලකලේ විකිලීක්ස් වෙත ස්වයං වාරනයක් පනවා ගන්නා ලෙස උනන්දු කොට එය ධවල මන්දිරය සමග බේරාගන්නා ලෙස බලකිරීමෙන් පසුව පමනි. පුවත් පතේ ප්‍රධාන නිගමනය වූයේ හෙලිදරවු වුනු ලියවිලි ඇෆ්ගනිස්ථානය තුල යුද්ධය තීව්‍රකරමින් එය පාකිස්තානය තුල වඩා ආක්‍රමනශීලීව දිගේලි කල යුතු බවයි. එක්සත් ජනපද මිලිටරිය ඕනෑවට වැඩි සීමාකිරීම්වලට යටත් කර ප්‍රමානවත් සම්පත් දී නොමැති "කාර්යක්ෂමතාව සීමාකල" යුද්ධයක් පිලිබඳ සාක්ෂියක් ලෙස එම ලියවිලි ඉදිරිපත් කිරීමට එය උත්සාහ දරා ඇත. *ටයිම්ස්* මෙම අදහස ඉස්මත්තට දමන්නේ ඇෆ්ගනිස්ථානය තුල ප්‍රචන්ඩත්වය පිලිබඳ විස්මයජනක මට්ටමක සාක්ෂි මධ්‍යයේ ය.

*ටයිම්ස්* වෙත තිබෙන සම්පත් හා සසඳන කල ඉන් කුඩා කොටසක් පමනක් හිමි අන්තර්ජාල සංවිධානයක් වන විකිලීක්ස් මගින් මෙම හෙලිදරවු කිරීම් කිරීම සමස්තයක් ලෙස මාධ්‍යයන් පිලිබඳ චෝදනා පත්‍රයකි. සිය "කැපවුනු" වාර්තාකරුවන් සහිත *ටයිම්ස්* සහ අනෙකුත් ප්‍රවෘත්ති සංවිධාන නිසැකව ම හෙලිදරවු වූ ලියවිලිවලින් අනාවරනය වන සිද්ධි ගැන දැන සිටින්නට ඇති අතර ඒවා වාර්තා කිරීමට තෝරා නො ගත්හ. පෙන්ටගනය සහ දේශපාලන සංස්ථාපිතයට නො අඩු ලෙස ඔවුන් ද ඇෆ්ගන් ජනයාට එරෙහිව සිදු කෙරෙන අපරාධ පිලිබඳ ක්‍රමානුකුල වහංගු කිරීමක් පවත්වාගෙන ගොස් තිබේ.

50,000ක පමන නැටෝ සහ අනෙකුත් විදේශීය හමුදාවන්ට අමතරව ඉදිරියේ එලැඹෙන දෙසතිය ඇතුලත ඇමරිකානු හටයින් සංඛ්‍යාව 100,000 කරා වැඩි කරමින් ඇෆ්ගන් යුද්ධය තීව්‍ර කිරීමට ඔබාමා දරන ප්‍රයත්නයට, 2008 නොවැම්බර් මැතිවරනය ආසන්න සමයේ සියලු අභිප්‍රායන් සහ අපේක්ෂාවන් අතින් තම සල්පිල වසාදැමූ, "යුදවිරෝධී" ව්‍යාපාරයේ දනගැසීම ද පහසුකම් සලසා දෙනු ලැබ ඇත.

ඉරාකයේ සහ ඇෆ්ගනිස්ථානයේ යුද්ධයන්ට එරෙහි මහජන විරුද්ධත්වය ඩිමොක්‍රටික් පක්ෂයට සහාය දීමේ ආරක්ෂක නාලිකාවට අපසරනය කිරීම සඳහා වසර ගනනාවක් ක්‍රියාත්මක වූ විරෝධතා කල්ලිවල ලිබරල්ලු සහ හිටපු රැඩිකල් කන්ඩායම් බොහෝ කොට ඇෆ්ගනිස්ථානයේ පවත්නේ "හොඳ යුද්ධයකි" ය යන නිල අදහස පිලිගනිමින් ඔබාමාගේ "ප්‍රගතිශීලී" න්‍යාය පත්‍රය වැලඳගෙන ඇත. මෙම නිල අදහසට විපරීතව මේ සතියේ අනාවරනය වූ යෝධ සාක්ෂි ප්‍රමානය එම අදහස වෙනස් කරතැයි අපේක්ෂා කිරීමට හේතුවක් නැත.

මත විමසුමෙන් මත විමසුමට අනාවරනය වන පරිදි ඉරාකය සහ ඇෆ්ගනිස්ථානය තුල එක්සත් ජනපද යුද්ධයන්ට එරෙහිව අනවරත මහජන විරුද්ධත්වයක් පැවතුනත් එක්සත් ජනපද පිලිවෙත මාරුකිරීමට එම විරෝධය අසමත් වීම නිසා නිසැකව ම යම් මට්ටමක මන්දෝත්සාහී භාවයක් පැවතිය හැක. 2008 දී මිලියන ගනනක් යුද්ධයට එරෙහිව ඡන්දය දීමට ඡන්දපොලවලට ගිය නමුත් ප්‍රතිඵලය වූයේ ඇෆ්ගන් ජනයාට එරෙහි ත්‍රස්ත ව්‍යාපාරය තීව්‍ර කර ඉරාක

වාඩිලාගැනීම දිගටම පවත්වාගෙන ගොස් ඇති ඔබාමා පරිපාලනය බිහිවීම පමනි.

අවශ්‍ය වන්නේ අව්‍යාජ මහජන යුද-විරෝධී ව්‍යාපාරයක් සංවිධානය කිරීම යි. යුද්ධයට එරෙහි සැබෑ විරුද්ධත්වයක් වර්ධනය කලහැකි වන්නේ මිලිටරිවාදයේ මූලාශ්‍රය වන ලාභ පද්ධතියට සහ එය ආරක්ෂා කරමින් දිරිගන්වන ඩිමොක්‍රටික් සහ රිපබ්ලිකන් පක්ෂවලට එරෙහිව කම්කරු පන්තිය ස්වාධීනව බලමුලුගැන්වීමේ අරගලයේ කොටසක් ලෙස පමනි. මෙම ව්‍යාපාරය වහා ම හා කොන්දේසි විරහිතව ඇෆ්ගනිස්ථානයෙන් සහ ඉරාකයෙන් සියලු ඇමරිකානු සහ අනෙකුත් විදේශ හමුදා ඉවත් කිරීමේ ඉල්ලීම පෙරට දැමිය යුතු ය. ආක්‍රමනකාරී යුද්ධයන් ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් බුෂ් සහ ඔබාමා යන පරිපාලනයන් දෙකෙහි ම වගකිව යුත්තන්ට දඬුවම් පැමිනවිය යුතු ය යන ඉල්ලීම ද එම ව්‍යාපාරය විසින් පෙරට දැමිය යුතු ය.

බිල් වැන් ඕකන්

© www.wsws.org